විශිෂ්ට පරමාදර්ශී අභිමානවත් පළාත් සභා රාජ්‍ය සේවයක්

**පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව - බස්නාහිර පළාත**

மாகாண சபை அரசாங்க சேவை ஆணைக்குழு – மேல் மாகாணம்

**PROVINCIAL COUNCIL PUBLIC SERVICE COMMISSION – WESTERN**

අංක 628,10 වන මහල,ජන ජය සිටි ගොඩනැගිල්ල,නාවල පාර,රාජගිරිය இல.628, 10 வதுமாடி, ஜனஜயசிட்டிவளாகம், நாவலவீதி, ராஜகிரிய No.628,10th Floor,Jana Jaya City Building,NawalaRoad,Rajagiriya


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Ref. | WPC/PSC/EXM04/01 | ඔබේ අංකය / உமது இல. / Your Ref. | | දිනය / திகதி / Date | 2025.05.16 |

ප්‍රධාන ලේකම්, (බ.ප.)
ලේකම්, සියළු අමාත්‍යාංශය (බ.ප.)

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය නොවූ ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ තනතුරුවලට අදාළ II ශ්‍රේණියේ දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2025**

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය නොවූ ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ තනතුරුවලට අදාළ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය වෙනුවෙන් මාගේ සමාංක හා 2025.05.14 දිනැති ලිපියෙන් අයදුම්පත් කැඳවා ඇත.

02. ඒ සඳහා අයදුම්කරනු ලබන සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය නොවූ ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ තනතුරුවලට අදාළ II ශ්‍රේණිය සඳහා උසස්වීම ලබා ඇති සුදුසුකම්ලත් අයදුම්කරුවන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.wp.gov.lk ඔස්සේ මාර්ගගත ක්‍රමය මඟින් (Online) **2025.05.30.** දිනට පෙර අයදුම් කල යුතු අතර, එම අයදුම්පත්වල මුද්‍රිත පිටපත් **2025.06.06.** දිනට පෙර නියමිත ධූරාවලිය ඔස්සේ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කල යුතුය. මෙම දින වලින් පසුව ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. මෙම විභාග සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන නිලධාරීන් සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය නොවූ ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ තනතුරුවලට අදාළ II ශ්‍රේණියට උසස්වීමේ ලිපිය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් නිකුත් කර තිබීම අනිවාර්යය වේ.

04. මේ සම්බන්ධයෙන් ඔබ කාර්යාලයේ හා ඔබ යටතේ වන කාර්යාලවල නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත්, මෙම විභාගයට පෙනී සිටීමට අයදුම්කරුවන් නොමැත්තේ නම් ඒ බවද දන්වා එවීමට කටයුතු කරන ලෙසත් වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

තිලක් සෙනරත්
ලේකම්,
පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.


Tel – 0112879614
Fax – 0112879512
email – ppscwprec@sltnet.lk

විශිෂ්ට පරමාදර්ශී අභිමානවත් පළාත් සභා රාජ්‍ය සේවයක්

# පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව - බස්නාහිර පළාත
# மாகாண சபை அரசாங்க சேவை ஆணைக்குழு – மேல் மாகாணம்
# PROVINCIAL COUNCIL PUBLIC SERVICE COMMISSION – WESTERN

අංක 628,10 වන මහල,ජන ජය සිටි ගොඩනැගිල්ල,නාවල පාර,රාජගිරිය இல.628, 10 வதுமாடி, ஜனஜயசிட்டிவளாகம், நாவலவீதி, ராஜகிரிய No.628,10th Floor,Jana Jaya City Building,NawalaRoad,Rajagiriya


474

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | WPC/PSC/EXM04/01 | ඔබේ අංකය<br>உமது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2025.05. 14 |

ප්‍රධාන ලේකම්, (බ.ප.)
ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය (බ.ප.)

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය නොවූ ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ තනතුරුවලට අදාළ II ශ්‍රේණියේ දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2025**

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය නොවූ ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ තනතුරුවලට අදාළ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගය වෙනුවෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. ඒ සඳහා අයදුම්කරනු ලබන සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය නොවූ ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ තනතුරුවලට අදාළ II ශ්‍රේණිය සඳහා උසස්වීම ලබා ඇති සුදුසුකම්ලත් අයදුම්කරුවන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.wp.gov.lk ඔස්සේ මාර්ගගත ක්‍රමය මඟින් (Online) **2025.05.30.** දිනට පෙර අයදුම් කල යුතු අතර, එම අයදුම්පත්වල මුද්‍රිත පිටපත් **2025.06.06.** දිනට පෙර නියමිත ධූරාවලිය ඔස්සේ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කල යුතුය. මෙම දින වලින් පසුව ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. මෙම විභාග සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන නිලධාරීන් සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය නොවූ ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ තනතුරුවලට අදාළ II ශ්‍රේණියට උසස්වීමේ ලිපිය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් නිකුත් කර තිබීම අනිවාර්යය වේ.

04. මේ සම්බන්ධයෙන් ඔබ කාර්යාලයේ හා ඔබ යටතේ වන කාර්යාලවල නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත්, මෙම විභාගයට පෙනී සිටීමට අයදුම්කරුවන් නොමැත්තේ නම් ඒ බවද දන්වා එවීමට කටයුතු කරන ලෙසත් වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

තිලක් සෙනරත්
ලේකම්,
පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

Tel – 0112879614
Fax – 0112879512
email – ppscwprec@sltnet.lk

## බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය නොවූ ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ තනතුරුවලට අදාළ II ශ්‍රේණියේ දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2025

➢ **සැලකිය යුතුයි - සියලුම අයදුම්කරුවන් මාර්ගගත ක්‍රමය (Online) යටතේ පමණක් අයදුම්කළ යුතුය.**

01. උක්ත විභාගය යථා කාලයේදී බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන අතර එම දිනය පිළිබඳ තොරතුරු අයදුම්කරුවන්හට නිල කෙටි පණිවුඩයක් මගින් දන්වා එවනු ලැබේ.

02. යෝග්‍යතාව

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ **සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය නොවූ ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ තනතුරුවලට අදාළ II ශ්‍රේණියට උසස්වීම ලබා ඇති** නිලධාරීන් පමණක් මෙම විභාගයට පෙනී සිටීම සඳහා සුදුස්සෝ වෙති. අයදුම්කරුවන් විසින් අයදුම්පතෙහි මුද්‍රිත පිටපත සමඟ II ශ්‍රේණියට උසස් කිරීමේ ලිපියේ පිටපතක් අමුණා එවිය යුතුය.

03. විභාගයට පෙනී සිටීම සඳහා සියලුම අයදුම්කරුවන් මාර්ගගත ක්‍රමය (Online) ඔස්සේ පමණක් අයදුම්කළ යුතුය. එසේ අයදුම්කිරීමෙන් පසු යොමු අංකය සහිත මුද්‍රිත පිටපත ආයතන ප්‍රධානියා මගින් ධූරාවලිය ඔස්සේ අයදුම්පත් යොමු කළ යුතු අවසාන දිනට පෙර එවීමට කටයුතු කළ යුතුය.

(අ) **2025.05.30** දින හෝ ඊට පෙර මාර්ගගත (Online) ක්‍රමය යටතේ අයදුම් කරන ලද මුද්‍රිත අයදුම්පත්‍ර **2025.06.06** දින හෝ ඊට පෙර ලැබෙන සේ **"ලේකම්, පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප), අංක 628, 10 වන මහල, ජන ජය සිටි ගොඩනැගිල්ල රාජගිරිය"** යන ලිපිනයට තම දෙපාර්තමේන්තු ප්‍රධානියා, අමාත්‍යාංශ ලේකම් (බ.ප), මගින් එවිය යුතුය. එසේ කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් නුසුදුස්සන් ලෙස සලකනු ලැබේ.

**සටහන : අයදුම්පත්‍ර බස්නාහිර සභා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ හෝ මෙම කාර්යාලයේ වෙනත් නිළධාරියෙකුගේ නමට පෞද්ගලිකව නොඑවිය යුතුයි.**

(ආ) මෙම නිවේදනයේ අවශ්‍යතාවන්ට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. කිසියම් ඉල්ලුම්පත්‍රයක් තැපෑලෙන් නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කරන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ.

04. විභාග ගාස්තු

පළමු වතාවට ඉදිරිපත් වන අයදුම්කරුවන්ට විභාග ගාස්තු ගෙවීම අවශ්‍ය නොවේ. ඉන්පසුව විභාගයට පෙනී සිටින අපේක්ෂකයන් විභාග ගාස්තු ලෙස, **රු.300/- ක්** බස්නාහිර පළාත් ආදායම් **ශීර්ෂ 20-03-02-99** ට බැර වන පරිදි ළඟම පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ලබා ගන්නා ලද බ.ප **1** ලදුපත අයදුම්පත්‍රයට නොගැලවෙන සේ අමුණා එවිය යුතුය.

05. පැවරුම සඳහා විෂය නිර්දේශය

| පැවරුම | විෂය නිර්දේශය |
|---|---|
| නිලධරයා විසින් තම රාජකාරීමය අත්දැකීම් අනුසාරයෙන් යෝජනා කරනු ලබන, බස්නාහිර පළාත් සභාව විසින් ක්‍රියාත්මක කිරීමට සුදුසු සංවර්ධන ව්‍යාපෘතියක් පිළිබඳව, ව්‍යාපෘති කළමනාකරණ මූලධර්මවලට අනුකූලව වචන 1,500කට නොඅඩු නිබන්ධනයක් සකස් කිරීම | 01. ව්‍යාපෘතිය හඳුනාගැනීම<br>02. ව්‍යාපෘතිය සැලසුම්කරණය සහ උපායමාර්ග<br>03. ව්‍යාපෘති වාර්තා සැකසීම සහ ඇගයීම<br>04. ප්‍රගති සමාලෝචනය |

06. <u>නිබන්ධනය සකස් කිරීම පිළිබඳ උපදෙස්</u>

නිලධරයා විසින් තම රාජකාරීමය අත්දැකීම් අනුසාරයෙන් යෝජනා කරනු ලබන, බස්නාහිර පළාත් සභාව විසින් ක්‍රියාත්මක කිරීමට සුදුසු සංවර්ධන ව්‍යාපෘතියක් පිළිබඳව, ව්‍යාපෘති කළමනාකරණ මූලධර්මවලට අනුකූලව නිබන්ධනයක් අපේක්ෂකයා විසින් ඉදිරිපත් කළ යුතුවේ.

මෙම නිබන්ධනය ඉදිරිපත් කිරීමට පෙර අපේක්ෂකයා විසින් ඉහත උපදෙස් පරිදි 2025.05.30 දිනට පෙර මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්කල යුතු අතර, ඉන් අනතුරුව අයදුම්පතේ මුද්‍රිත පිටපත 2025.06.06 දිනට පෙර කොමිෂන් සභාව වෙත එවිය යුතුවේ.

එසේ අයදුම්පත් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමෙන් පසු නිබන්ධනය සකස් කර එවිය යුතු දිනය පිළිබඳව අපේක්ෂකයා වෙත දන්වා එවනු ලැබේ.

එසේ දන්වා එවීමෙන් පසු පහත ලබාදී ඇති උපදෙස්වලට අනුකූලව නිබන්ධනය සැකසිය යුතුවේ.

- සිංහල භාෂාවෙන් නම් අකුරු වර්ගය **(Font type) Iskoola pota** විය යුතුය.
- අකුරු ප්‍රමාණය **(Font size)** 12 විය යුතුය.
- සම්පූර්ණ නිබන්ධනය වචන **1500**ට නොඅඩු විය යුතුය.
- නිලධාරියා පත්වීම ලද මාධ්‍යයෙන් නිබන්ධනය ඉදිරිපත් කළ යුතුය.
- විෂයය නිර්දේශයට අදාල සියළු කරුණු ආවරණය විය යුතුය.
- මේ සඳහා සහය ලබා ගන්නා ආශ්‍රිත ග්‍රන්ථ, වෙබ් අඩවි පිළිබඳව සඳහන් කළ යුතුය.

මෙම උපදෙස්වලට අනුකූලව අදාළ නිබන්ධනය සැකසිය යුතුවේ.

සටහන් : **නිබන්ධනය සඳහා ලබාදෙන උපරිම ලකුණු ප්‍රමාණය 100 වන අතර, සමාර්ථය ලැබීම සඳහා අවම ලකුණු 40 % ක් වත් ලැබිය යුතුය.**

**07.** මෙම විභාග නිවේදනයට අනුව විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳ වුවද, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේය.

තිලක් සෙනරත්
ලේකම්
පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.
2025.05.16

Tel - 0112879614
Fax – 0112879512
email – ppscwprec@sltnet.lk